WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

45 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

භරත නැටුම් I, II
பரத நாட்டியம் I, II
Bharatha Dancing I, II

## භරත නැටුම් II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා අනෙකුත් ප්‍රශ්නවලින් **හතරක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) සංකීර්ණ නඩෛවලට අදාළ සොට්කට්ටුව කුමක් ද?
(ii) කංගානිවරු හා කනක්කපුල්ලේවරු යන අය මුල් කරගෙන නටන ගැමි නැටුම් මොනවා ද?
(iii) "0" ලෙස දැක්වෙන සංකේතයේ නම කුමක් ද?
(iv) 'කපුටා' වාහනය ලෙස යොදාගෙන ඇති දෙවියන් දැක්වීමට භාවිත කරන්නේ කුමන හස්තම් ද?
(v) මල්වලින් අංජලි පුදමින් නටන නැටුම කුමක් ද?
(vi) අට්පුද රසම්හි ස්ථායි භාවම් ලියන්න.
(vii) කුච්චිපුඩි නැටුම් අයත් වන්නේ කුමන ප්‍රාන්තයට ද?
(viii) අලවයූර් දක්ෂිණාමූර්ති සහ ඉනුවිල් සින්නරාජා යන අය වාදනය කළ භාණ්ඩය කුමක් ද?
(ix) නිරුත්ත උරුප්පඩියට උදාහරණ **දෙකක්** ලියන්න.
(x) ඇතින් ම මුෂ්ටි හස්තම් භාවිත කර අභිනයෙන් පෙන්වන දසඅවතාර සහ නවග්‍රහ හස්තම් නම් කරන්න.

**2.** (i) භරත නාට්‍ය කච්චේරිවල දී ප්‍රථමයෙන් නටන උරුප්පඩියේ රාගය සහ තාලය ලියන්න.
(ii) ඉහත (i) හි සඳහන් උරුප්පඩියේ ලක්ෂණ ලියන්න.
(iii) ඉහත (i) හි සඳහන් උරුප්පඩියේ තීර්මානම් කොටසේ සිට අග දක්වා සංගීත සංකේත මගින් දක්වන්න.

**3.** (i) ඉන්දීය ශාස්ත්‍රීය නැටුම් වර්ග **හතරක්** නම් කරන්න.
(ii) පහත සඳහන් කරුණු ඇසුරින් ඉන්දීය නැටුම්වල කථක් නැටුම් පිළිබඳව ලියන්න.

- උපත
- වර්ධනය
- එහි දියුණුවට කටයුතු කළ පුද්ගලයින්
- ඇඳුම් හා ආභරණ
- භාවිත කරන ප්‍රධාන සංගීත භාණ්ඩය

**4.** පහත සඳහන් හස්තම්වලට අදාළ විනියෝග, ඒවායේ ශ්ලෝක හා අර්ථ සමග ලියන්න.

(i) කඩකාමුඛම් (ii) චන්ද්‍රකලා
(iii) සම්පුඩම් (iv) ඩෝලම්

**5.** වලුවූර් රාමයියාපිල්ලෙ පිළිබඳ විස්තරයක් ලියන්න.

**6.** පහත සඳහන් ඒවා පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) කෝර්වෛ (ii) පාත්තිර පිරාණින් (iii) වාත්සල්‍ය භාවම්

**7.** (i) ගැමි නැටුම් අතුරින් කාවඩි නැටුම් පිළිබඳව පහත සඳහන් කරුණු ඇසුරින් පැහැදිලි කරන්න.

- හැඳින්වීම
- නැටුම් වර්ග
- ගීත වර්ග
- ඇඳුම් හා ආභරණ
- භාවිත කරන සංගීත භාණ්ඩ

(ii) ඔබ නරඹා ඇති කාවඩි නැටුමක දක්නට ලැබුණු හොඳ ලක්ෂණ හා අඩුපාඩු සඳහන් කර, එම අඩුපාඩු මගහරවා ගැනීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න.

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....